**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


නිවේදන අංකය : **04** WW/O/23/02/01/01
වර්ණය : රතු

# පීඩන අවපාතය පිලිබඳ අනතුරු ඇඟවීම් නිවේදනය


**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2023 පෙබරවාරි මස 02 දින පෙ.ව. 10.00 තෙක් වලංගු වන පරිදි
2023 පෙබරවාරි මස 01 දින පෙ.ව. 10.00 ට නිකුත් කරන ලදී.
.

**ගොඩබිම ප්‍රදේශ , දිවයින වටා ඇති ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සහ නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය සඳහා**

## සැලකිලිමත් වන්න!

**ගිනිකොන දිග බෙංගාල බොක්ක ආශ්‍රිතව පවතින පීඩන අවපාතය ආසන්නව බටහිර දෙසට ගමන් කරමින් පවතින අතර අද (01) උදෑසන 05.30 වනවිට මඩකලපුවට කිලෝමීටර් 110 ක් පමණ නැගෙනහිරට බරව ගිනිකොන දෙසට වන්නට අක්ෂාංශ 8.2°N සහ දේශාංශ 82.6°E ආසන්නයේ කේන්ද්‍රගතව පැවතුනි.**

**එම පද්ධතිය බටහිරට බරව නිරිත දෙසට හැරී ගමන්කර 2023 පෙබරවාරි 01 දින ලංකාවේ නැගෙනහිර වෙරළ තීරය වෙතට ගමන් කිරීමට ඉඩ ඇත.**




**Expected path of the cyclone (Source: RSMC-India)**

**පද්ධතියේ පුරෝකථන මාර්ගය සහ පද්ධතියේ තීව්‍රතාවය**

| දිනය/වේලාව) (ශ්‍රී ලංකා පැය) | ස්ථානය (උතුරු අක්ෂාංශ °N නැගෙනහිර දේශාංශ °E) | උපරිම සුළගේ වේගය (පැයට කි. මී.) | කැළඹිලි ස්වභාවය | දුර |
|---|---|---|---|---|
| 01.02.23/1730 | 7.4/81.6 | 45-55 විටින් විට 65 | පීඩන අවපාතය | ගොඩබිම තුල |
| 02.02.23/0530 | 6.5/80.7 | 40-50 විටින් විට 60 | පීඩන අවපාතය | ගොඩබිම තුල |


**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**


TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## ගොඩබිම සඳහා:

**උතුරු සහ උතුරු-මැද පළාත්වලත් ත්‍රිකුණාමලය සහ පුත්තලම දිස්ත්‍රික්කවලත්, ඇතැම් ස්ථානවලට මි.මී. 150ක පමණ ඉතා තද වැසි ඇතිවිය හැකිය. කුරුණෑගල, මාතලේ, මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථානවලට මි.මී. 100 ට වැඩි තද වැසි ඇතිවිය හැකිය.**

**උතුරු, උතුරු-මැද,** නැගෙනහිර, වයඹ සහ මධ්‍යම පළාත්වල විටින් විට හමන පැ.කි.මී. (50-60) පමණ තද සුළං බලාපොරොත්තු විය හැකි අතර දිවයිනේ සෙසු ප්‍රදේශ වල විටින් විට හමන පැ.කි.මී. (40-50) පමණ තද සුළං බලාපොරොත්තු විය.




අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:

- කඳුකර ප්‍රදේශවල (විශේෂයෙන් නාය යාම් අවධානම සහිත ප්‍රදේශ වල) සහ ගංගා ආශ්‍රිතව පහත් බිම් වල ජීවත් වන ජනතාව මේ සම්බන්ධයෙන් විමසිලිමත්වන්න.
- කඳුකර ප්‍රදේශ වල මාර්ග භාවිත කරන්නන් සහ රථ වාහන පදවන්නන් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.
- අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්න.
- **කඩාවැටෙන ගස්වලින් සහ විදුලි රැහැන් වලින් ආරක්ෂාවීම.**
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉදිරි නිවේදන පිලිබඳ අවධානයෙන් සිටින්න.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ නිලධාරීන් ගේ සහය පතන්න.

---

## මුහුදු ප්‍රදේශය සඳහා:


**ගැඹුරු බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශ සඳහා**
උතුරු අක්ෂාංශ 05 ත් 12ත් සහ නැගෙනහිර දේශාංශ 78 සහ 88 ත් අතර මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. (40-50) පමණ වන අතර විටින් විට පැ.කි.මී. (60-70) දක්වා වැඩිවිය හැක. ඉහත කී මුහුදු ප්‍රදේශ ඉතා රළු හෝ රළු වන අතර තද වැසි හෝ ගිගුරුම් සහිත වැසිද ඇතිවිය හැක.

**දිවයින වටා මුහුදු ප්‍රදේශ සඳහා**
පොතුවිල් සිට මඩකළපුව, ත්‍රිකුණාමලය, කන්කසන්තුරය සහ මන්නාරම හරහා පුත්තලම දක්වා වන මුහුදු ප්‍රදේශයේ සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. (55-60)** දක්වා වැඩි විය හැකි අතර **මුහුදු රළ උස මීටර් (2.5-3.0) ක් පමණ** ඉහළ යාමේ හැකියාවක් ද පවතී. එබැවින් එම මුහුදු ප්‍රදේශය රළු වන අතර විටින් විට ඉතා රළු වේ. ඉහත කී මුහුදු ප්‍රදේශ ඉතා රළු වන අතර තද වැසි හෝ ගිගුරුම් සහිත වැසිද ඇතිවිය හැක.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**Advisory for Fishing and Naval Communities**
**issued at 09.30 p.m. on 01 February 2023, valid for next 24 hours**




**අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

- **උතුරු අක්ෂාංශ 05 සහ 12 ත්, නැගෙනහිර දේශාංශ 79 සහ 88 ත් අතර මුහුදු ප්‍රදේශයට ඉදිරි පැය 24 තුල යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**
- **දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩ බිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.**
- **කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

******ඊළඟ නිවේදනය 2023.02.02 දින පෙ.ව. 09.30 ට ට නිකුත් කෙරේ.**